**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**
**පුනරික්ෂණ ප්‍රශ්න පත්‍රය.**

**ගිණුම්කරණය II** **කාලය-පැය තුනයි** සියලුම හිමිකම් ඇවිරිණි

*සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන්*

*සැලකිය යුතුයි :- පළමු සහ දෙවන ප්‍රශ්න ඇතුලුව ප්‍රශ්න 06කට පිළිතුරු සැපයිය යුතුයි.*

1. සීමිත සමුද්‍ර පොදු සමාගම් 2013.03.31 දිනට ශේෂ පිරික්සුමෙන් උපුටාගත් අයිතමයන් පහත දී ඇත.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 450000) | | 9 000 |
| 2012.04.01 දිනට සංචිත - පොදු සංචිතය | | 1 000 |
| රඳවාගත් ඉපැයුම් | | 600 |
| දේපළ පිරියත උපකරණ -ඉඩම් | 2 000 | |
| ගොඩනැගිලි | 2 200 | |
| මෝටර් රථ | 8 000 | |
| ලී බඩු හා උපකරණ | 1 700 | |
| පරිගණක | 100 | |
| 2012.04.01 දිනට ක්ෂය වෙන් කිරීම් - ගොඩනැගිලි | | 220 |
| මෝටර් රථ | | 390 |
| ලී බඩු උපකරණ | | 180 |
| පරිගණක | | 20 |
| ගෙවූ ලාභාංශ | 800 | |
| බෙදා හැරීමේ වියදම් | 1 250 | |
| පරිපාලන වියදම් | 1 700 | |
| වෙනත් වියදම් | 200 | |
| වෙනත් ආදායම් (කොමිස් ආදායම්) | | 800 |
| විකුණුම් | | 8 200 |
| විකුණුම් පිරිවැය | 3 500 | |
| මූල්‍ය වියදම් | 60 | |
| 2012.04.01 දිනට බදු වෙන් කිරීම | | 250 |
| ගෙවූ බදු 2011/2012 වර්ෂය සඳහා | 300 | |
| 2012/2013 වර්ෂය සඳහා | 900 | |
| 2013.03.31 දිනට බදු වෙන් කිරීම | | 400 |
| 2012.04.01 දිනට අඩමාන ණය වෙන් කිරීම | | 60 |

අතිරේක තොරතුරු

(I) පරිපාලන වියදම් තුළ පහත සඳහන් වියදම් ඇතුළත් වේ.

| | රු |
|---|---|
| අධ්‍යක්ෂ සංවේතන | 600 000 |
| විගණන ගාස්තු | 50 000 |
| සේවකදළ වේතන | 700 000 |

(II) සේවක අර්ථසාධක අරමුදල් සේවක හා සේව්‍ය දායක පිළිවෙලින් 10% හා 15% වේ. සේවක දායකය පමණක් නිවැරදිව ගිණුම්ගත කර ඇත. සේව්‍ය දායකය ගිණුම්ගත කර හෝ ගෙවා නැත.

(III) 2013.03.31 දින සාධාරණ අගය රු3 500 000 ක් වූ මෝටර් රථයක් සමාගම මූල්‍ය කල්බදු ක්‍රමයට ලබා ගෙන ඇත. මූලික ගෙවීම් වූ රු 500 000 එදින ගෙවා මෝටර් රථ ගිණුමට හර කර ඇත.
රු 720 000 බැගින් වූ ඉතිරි වාර්ෂික වාරික පහ මෝටර් රථ ගිණුමට හර කර කල්බදු ණය ගිණුමට බැර කර ඇත.

(IV) වර්ෂය තුළ ඉඩම් ප්‍රත්‍යාගණය කර ඇති වූ ප්‍රත්‍යාගණන ලාභය රු 300 000ක් සම්බන්ධව සටහන් තබා නැත.

(V) 2012.10.01 දිනට පිරිවැය රු 200 000ක් වූ සහ රු 180 000ක් ශුද්ධ අගය වූ උපකරණයක් රු 100 000 කට විකිණීමෙන් ලද චෙක්පත බැංකු ගිණුම හර කර උපකරණ ගිණුමට බැර කිරීම හැර වෙනත් සටහනක් තබා නැත.

(VI) වර්ෂය තුළදී පාරිභෝගිකයකු සමාගමට විරුද්ධව රු 200 000ක වන්දියක් ඉල්ලා පවරා ඇති නඩුවක් විභාග වෙමින් පවතී. ගෙවිය යුතු වන්දිය විශ්වාසනීය ලෙස තක්සේරු කළ නොහැකි බව සමාගම් නීතිඥයෝ පවසති. ඉල්ලා ඇති වන්දිය සඳහා ප්‍රතිපාදනයන් කර වෙනත් වියදම් තුළ ඇතුළත් කර ඇත.

(VII) 2013.01.01 දින සමාගම රු 20 බැගින් වූ කොටස් 50 000ක ප්‍රසාද නිකුතුවක්, පොදු සංචිතය භාවිත කරමින් සිදු කර නිසි පරිදි ගිණුම්ගත කර ඇත.

(VIII) ප්‍රසාද නිකුතුවට පෙර තිබූ කොටස් සඳහා එකකට රු2 බැගින් ලාභාංශ ගෙවීමට යෝජනා සම්මත වී ඇත.

(IX) දේපළ පිරියත උපකරණ පිරිවැය මත වාර්ෂික ක්ෂය අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලී බඩු හා උපකරණ | 5% |
| මෝටර් රථ | 10% |
| පරිගණක | 20% |

(X) බොල් ණය කපා හැරීම රු 30 000 ක් බෙදා හැරීමේ වියදම් තුළ ඇතුළත්ව ඇති අතර වර්ෂය අවසානයේ අඩමාන ණය ඌන වෙන් කිරීම රු 50 000 ක් පිළිබඳව සටහන් තබා නැත.

**අවශ්‍ය වන්නේ,**

(1) 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
(2) 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය
(3) 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයට අදාළ සටහන්
(4) 2013.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු දේපළ පිරියත උපකරණ සම්බන්ධ සටහන

**(ලකුණු 20)**

**2. (අ)** සීමිත ලිලියන් සමාගමට අදාළ තොරතුරු පහත දැක්වේ.

(i) තෝරාගත් ගිණුම් ශේෂ

| **අයිතමය** | **2013.03.31** (රු.'000) | **2012.03.31** (රු.'000) |
|---|---|---|
| තොග | 8 500 | 7 000 |
| ණය ගැතියෝ | 7 200 | 9 000 |
| ණය හිමියෝ | 13 000 | 14 000 |
| උපචිත ණය පොලී | 600 | 200 |
| උපචිත ආදායම් ආදායම් බදු | 500 | 200 |
| දිගුකාලීන ණය | 15 000 | 18 000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 29 500 | 19 500 |
| රඳවාගත් ඉපයුම් | 8 000 | 5 000 |
| මුදල් හා මුදල් සමාන දෑ | 9 000 | 2 000 |

(ii) 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ උද්ධෘතයන් පහත වේ.

| | (රු'000) |
|---|---|
| විකුණුම් | 65 000 |
| දළ ලාභය | 20 000 |
| ක්ෂය | 3 000 |
| පොලී වියදම් | 2 250 |
| ආදායම් බදු | 1 800 |
| උපකරණ විකිණීමේ ලාභය | 500 |

(iii) වර්ෂයේ ලාභාංශ ගෙවීම් රු 750 000කි.

(iv) සියලු ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු වේ.

(v) 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ රු 8 000 000 ක් වටිනා මෝටර් රථයක් මිලදී ගෙන ඇති අතර ධාරණ අගය රු 2 000 000ක් වූ උපකරණ විකුණා ඇත.මේ හැරුණු කොට ජංගම නොවන වත්කම් මිලදී ගැනීමක් හෝ ඉවත් කිරීමක් වර්ෂය තුළ දී සිදුකර නොමැත.

(vi) වර්ෂය තුළ ප්‍රසාද කොටස් නිකුත් කිරීමක් සිදුකර නොමැති බවද ඔබට දන්වා ඇත.

**අවශ්‍ය වන්නේ,**

(1) 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
(2) ශුද්ධ ලාභ අනුපාතය
(3) පොලී ආවරණ අනුපාතය
(4) ණයගැති පිරිවැටුම් අනුපාතය
(5) ණය එකතු කිරීමේ කාලය
(6) තොග පිරිවැටුම් අනුපාතය **(ලකුණු 15)**

**(ආ)** එක් වර්ගයක භාණ්ඩ නිපදවා අලෙවි කරන සීමිත දළවත්ත සමාගමේ අභ්‍යන්තර ප්‍රයෝජනය සඳහා සකස් කළ ආන්තික පිරිවැයකරණය මත පදනම් වූ ආදායම් ප්‍රකාශය පහත දැක්වේ.

| | | | රු'000 |
|---|---|---|---|
| විකුණුම් | | | 20 000 |
| අඩු කලා- විචල්‍ය පිරිවැය- | නිෂ්පාදන | 6 000 | |
| | නිෂ්පාදන නොවන | 1 000 | 7 000 |
| දායකය | | | 13 000 |
| අඩු කලා- ස්ථාවර පිරිවැය- | නිෂ්පාදන | 4 000 | |
| | නිෂ්පාදන නොවන | 2 500 | 6 500 |
| මෙහෙයුම් ලාභය | | | 6 500 |

අතිරේක තොරතුරු අපේක්ෂිත විකුණුම් ඒකක ප්‍රමාණය 10 000

**අවශ්‍ය වන්නේ,**

(1) දායක විකුණුම් අනුපාතය
(2) ලාභ හෝ අලාභ නොලබන විකුණුම් වටිනාකම කොපමණද?
(3) ලාභ හෝ අලාභ නොලබන විකුණුම් වටිනාකම ඉක්මවා යන විකුණුම් ආදායම කොපමණද?
(4) රු 7 150 000ක ලාභයක් ලැබීම සඳහා ලඟා විය යුතු විකුණුම් වටිනාකම කොපමණද? **(ලකුණු 05යි)**

**(මුළු ලකුණු 20)**

**3.** කනිෂ්කා හා අනුෂ්කා හවුල්කරුවන් ය. 2012.12.31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන අතර, 2012.12.31 දින නව හවුල්කරුවකු ලෙසට තාරුකා බඳවා ගනු ලැබිය.

(I)හවුල් ගිවිසුම පහත පරිදි වේ.

| | | කනිෂ්කා හා අනුෂ්කා හවුල්ව්‍යාපාරය | කනිෂ්කා, අනුෂ්ක හා තාරුකා හවුල්ව්‍යාපාරය |
|---|---|---|---|
| ලභා ලාභ අනුපාතය පිළිවෙලින් | | 3: 2 | 5: 3:2 |
| මාසික හවුල් වේතන(රු): | | | |
| | කණිෂ්කා | 5 000 | 6 000 |
| | අනුෂ්කා | 4 000 | 5 000 |
| | තාරුකා | - | 4 000 |
| වාර්ෂික ප්‍රාග්ධන පොලී අනුපාතය | | 10% | 10% |

- තාරුකා ප්‍රාග්ධනය ලෙස රු 400 000 සැපයූ අතර, එය පොත්වල සටහන් කර නැත.
- කීර්තිනාමය රු 600 000 ලෙස තක්සේරු කළ අතර, ප්‍රාග්ධන ගිණුම්වලින් අවශ්‍ය ගැලපීම් කළ යුතුය.

(II)2012.01.01 දිනට ශේෂයන් පහත දක්වා ඇත.

| | | | (රු' 000) |
|---|---|---|---|
| හවුල්කරුවන්ගේ මුළු හිමිකම් | - | කනිෂ්කා | 850 |
| | - | අනුෂ්කා | 560 |
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ | - | කනිෂ්කා | 700 |
| | - | අනුෂ්කා | 600 |
| ක්ෂය වෙන් කිරීම් | - | ගොඩනැගිලි | 150 |
| | - | මෝටර් රථ | 300 |
| | - | යන්ත්‍ර | 60 |
| 10% ණය මුදල | - | කණිෂ්කා | 240 |

(III) 2012.12.31 න් අවසන් වර්ෂයේ ගණනය කර ඇති ශුද්ධ ලාභය රු 960 000ක් වන අතර, 2012.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ පහත දැක්වෙන ශේෂයන්ද ඉදිරිපත් කෙරේ.

| | | | (රු'000) |
|---|---|---|---|
| වෙළෙඳ ණයහිමියෝ | | | 310 |
| බැංකු ණය | | | 200 |
| බැංකු අයිරාව | | | 20 |
| ඉඩම් හා ගොඩනැගිලි (ඉඩම් රු. දහස් 500) | | | 1 700 |
| යන්ත්‍ර උපකරණ | | | 400 |
| මෝටර් රථ | | | 800 |
| තොගය | | | 245 |
| ණයගැතියෝ | | | 180 |
| ආයෝජන | | | 140 |
| ගැනිලි | - | කනිෂ්කා | 60 |
| | - | අනුෂ්කා | 45 |
| මුදල් | | | 80 |

(IV) පහත තොරතුරු ද සැලකිල්ලට ගත යුතුය.

1. රු 25 000 ගැනුම් ඉන්වොයිසියක් හා රු 30 000ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මග හැරී ඇත.

2. 2012.12.31 දිනටපැවති භාණ්ඩ තොගයේ පිරිවැය රු 85 000ක් වූ තොග කොටසක් හානියට පත් ව ඇති අතර,එම තොගය රු 60 000කට විකිණිය හැකි යැයි ඇස්තමේන්තු කර ඇතත් මීට අදාල ගැලපීම් සිදුකර නැත.

3. අනුජ්කාට අයත් ගොඩනැගිල්ලක ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යාම මත මසකට රු 15 000 බැගින් ගෙවිය යුතු කඩ කුලිය උපචිතව ඇත. හවුල් කරුවන්ගේ ණය සඳහා වූ පොලිය ද උපචිතව ඇත.

4. 2013 වර්ෂයේ සිට ණය පොලී හැර මසකට ගෙවිය යුතු බැංකු ණය වාරිකය රු 5 000 බැගින් වේ.

5. 2012 දෙසැම්බර් මාසය වෙනුවෙන් බැංකුවෙන් ලැබීඇති බැංකු ප්‍රකාශය හා සැසඳීමේදී පහත සඳහන් දෑ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන්ව නැත.

- අය කළ බැංකු ගාස්තුව රු 2 000
- ණයගැති සෘජු ප්‍රේෂණ ලැබීම් රු 35 000
- ආයෝජන ආදායම් ලැබීම් රු 15 000
- ස්ථාවර නියෝග මත අය කළ බැංකු ණය වාරිකය රු 18 000 (මෙහි ඇතුළත් රු 8 000 ක් බැංකු ණය පොලිය වේ.)

6. ස්ථාවර වත්කම් පහත පරිදි ක්ෂය වෙන් කළ යුතු වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි. (පිරිවැය මත) | 10% |
| මෝටර් රථය (ශුද්ධ අගය මත) | 10% |
| යන්ත්‍ර (පිරිවැය මත) | 20% |

7. කතිජ්කා තම පෞද්ගලික මුදලින් ගෙවා ඇති රු 30 000 ව්‍යාපාරික රක්ෂණ ගාස්තුව ප්‍රතිපූර්ණය කළ යුතු වුවත්, ඊට අදාළ ගැලපීම් කිසිවක් සිදුකර නැත.

**අවශ්‍ය වන්නේ,**

(1) 2012.12.31 න් අවසන් වූ වර්ෂයේ විසර්ජනය සඳහා වූ ශුද්ධ ලාභය ගණනය කිරීම
(2) 2012.12.31 න් අවසන් වූ වර්ෂයේ ශුද්ධ ලාභය විසර්ජනයකිරීම
(3) ජංගම ගිණුම්
(4) ප්‍රාග්ධන ගිණුම්
(5) 2012.12.31 දිනට ශේෂ පත්‍රය **(ලකුණු 20)**

**4. (අ)** සුපුන් නිෂ්පාදන ආයතනයේ සේවකයන්ට අදාළ තොරතුරු පහත දැක්වේ.

- ආයතනයේ සේවක සංඛ්‍යාව 20 කි.
- දිනකට පැය 08ක් සේවය කළ යුතුය.
- මසකට වැඩ කරන දින 20කි.
- එක් සේවකයකුගේ පැයක වැටුප රු 200කි.
- නොකඩව දින 20 ම සේවයට වාර්තා කළ සේවකයන් සඳහා දිරි දීමනාව රු.500කි.
- අතිකාල පැයක වැටුප සාමාන්‍ය පැයක වැටුප මෙන් 150% කි.
- මූලික වැටුප මත ආයතනය සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% දායක වන අතර සේවක දායකය 10% කි.
- සේවක භාරකාර අරමුදල් දායකය 3% කි. (එම ප්‍රමාණ ඉදිරි මාසයේ දී අදාළ ආයතන වෙත යවනු ලැබේ.)

2013.03.31 දිනෙන් අවසන් වූ මාසයේ වැටුප් ගෙවීමේ දී පහත තොරතුරු පදනම් කරගෙන ඇත.

- ආයතනයේ සේවකයන් මාසය තුළ පැය 4000ක් සේවයේ යෙදී ඇත.
- නොකඩ ව දින 20 පැමිණි සේවක සංඛ්‍යාව 10කි.
- සියලුම සේවකයන්ගේ වෘත්තිය සමිති දායක මුදල රු 100 මාසිකව වැටුපෙන් අඩුකර ගනී.
- සේවකයින් 12 දෙනෙකු සඳහා ආයතනය නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති බැවින් ඔවුන්ගේ මාසික වැටුපෙන් රු 2000 ක් බැගින් අයකර ගනී.
- 2013.03.31 දිනෙන් අවසන් මාසයේ දී ආයතනයේ සේවකයකු වූ සජිත් ආයතනයේ නේවාසිකාගාර පහසුකම් ගත් අතර නොකඩ ව දින 20 සේවයට වාර්තා කර ඇත. ඔහු පැය 200 මාසය තුළ සේවයේ යෙදී ඇත.

**අවශ්‍ය වන්නේ,**

(1) වැටුප් හා වේතන පාලන ගිණුම
(2) වෘත්තීය සමිති සාමාජික මුදල් ගිණුම
(3) නේවාසිකාගාර ආදායම් ගිණුම
(4) සේවක අර්ථසාධක අරමුදල් වෙත් කිරීමේ ගිණුම
(5) සේවක භාරකාර අරමුදල් වෙත් කිරීමේ ගිණුම
(6) සේවක සජිත්ට අදාල වැටුප් පත්‍රිකාව (2013 මාර්තු මාසයට) **(ලකුණු 07)**

**(ආ)** "නියෝ" නිෂ්පාදන සමාගම තම නිෂ්පාදනයන්ට අදාල ව නිෂ්පාදන අංශ 02ක් සහ සේවා අංශයක් පවත්වා ගනී. අදාල පිරිවැය මධ්‍යස්ථානයන් හි ඇස්තමේන්තුගත පොදු කාර්ය පිරිවැය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| වක්‍ර වැටුප් - | නිෂ්පාදන අංශය - x | - | රු 235 000 |
| | නිෂ්පාදන අංශය - y | - | රු 125 000 |
| | සේවා අංශය | - | රු 80 000 |
| | | | රු 440 000 |

| | | | |
|---|---|---|---|
| විදුලිය වියදම් | - | රු 80 000 | |
| කම්හල් කුලී | - | රු 50 000 | |
| යන්ත්‍ර රක්ෂණය | - | රු 30 000 | |
| සේවක රක්ෂණය | - | රු 20 000 | |
| යන්ත්‍ර ක්ෂය | - | රු 60 000 | |
| සේවක සුභසාධනය | - | රු 40 000 | රු 280 000 |
| | | | රු 720 000 |

පහත අමතර තොරතුරු ද සපයා ඇත.

| අංශය | යන්ත්‍ර සුත්‍රපිරිවැය | වර්ග මීටර් | සේවක සංඛ්‍යාව | යන්ත්‍ර පැය | සෘජු ශ්‍රම පැය |
|---|---|---|---|---|---|
| නිෂ්පාදන අංශය X | 300 000 | 600 | 20 | 14 000 | 4 000 |
| Y | 200 000 | 300 | 20 | 5 000 | 6 000 |
| සේවා අංශය | 100 000 | 100 | 10 | - | - |

සේවා අංශයේ වාර්තා අනුව නිෂ්පාදන අංශය සඳහා සපයන ලද සේවා පැය ගණන

- x නිෂ්පාදන අංශය - පැය 80
- y නිෂ්පාදන අංශය - පැය 40

**අවශ්‍ය වන්නේ ;**

(1) එක් එක් නිෂ්පාදන අංශය වෙනුවෙන් පොදු කාර්යය පිරිවැය විභජනය
(2) සේවා අංශයේ පිරිවැය නිෂ්පාදන අංශයන්ට විභජනය
(3) අන්තර්ග්‍රහණය කළ යුතු පොදු කාර්ය පිරිවැය
x - අංශය යන්ත්‍ර පැය අනුව
y -අංශය සෘජු ශ්‍රම පැය අනුව **(ලකුණු 08)**
**(මුළු ලකුණු 15)**

**5.(අ)** පවිත්‍රා ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. ව්‍යාපාරයේ යන්ත්‍රවලට අදාල තොරතුරු පහත දැක්වේ.

| යන්ත්‍ර වර්ගය | මිලදී ගත් දිනය | පිරිවැය (රු) | සුන්බුන් අගය(රු) | ඵලදායි ජීව කාලය (වර්ෂ) |
|---|---|---|---|---|
| A | 2009.01.01 | 445 000 | 45 000 | 8 |
| B | 2010.01.01 | 510 000 | 30 000 | 5 |
| C | 2010.04.01 | 300 000 | නැත | 6 |
| D | 2010.07.01 | 275 000 | 35 000 | 4 |

- සියළු යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.
- 2012.07.01 දින යන්ත්‍ර සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්කම් සිදු විය.

1. A යන්ත්‍රය රු 285 000කට විකිණී ය.
2. B යන්ත්‍රය සඳහාරු 60 000ක අමතර කොටසක් සවිකිරීම නිසා එහි ඵලදායී ජීව කාලය තවත් වසර 3 1/2 කින්ද සුන්බුන් අගය රු 12 000 කින්ද වැඩිවිය.
3. C යන්ත්‍රය රු 200 000 කට අගය කොට පැවරීමෙන් හා මුදලින් රු 120 000ක් ගෙවීමෙන් E නැමති නව යන්ත්‍රයක් මිලදී ගනු ලැබිය. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 5කි.
4. D යන්ත්‍රය යල් පැන ගොස් ඇති අතර එය සම්පූර්ණයෙන්ම පොත්වලින් කපා හැරීමට තීරණය විය.

**අවශ්‍ය වන්නේ,**

(1) 2012.12.31 අවසන් වර්ෂය සඳහා යන්ත්‍ර සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශනයට (ලාභා ලාභ ගිණුමට)ඇතුළත් කළ යුතු ක්ෂය වීම් ප්‍රමාණය වෙන වෙනම

(2) සියලුම යන්ත්‍ර සඳහා එක් යන්ත්‍ර ගිණුමක් හා යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුමක් පවත්වා ගන්නේ නම්, 2012.12.31 න් අවසන් වර්ෂය සඳහා

I. යන්ත්‍ර ගිණුම
II. යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම් ගිණුම
III. යන්ත්‍ර ඉවත් කිරීම් ගිණුම(යන්ත්‍ර හුවමාරුවද ඇතුළුව) **(ලකුණු 08)**

**(ආ)** පූර්ණ ව්‍යාපාරයේ 2013.03.31 න් අවසන් වූ අර්ධ වර්ෂය සඳහා පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| වත්කම් හා වගකීම් | (රු 000) 2012.07.01 | (රු 000) 2012.12.31 |
|---|---|---|
| බැංකු ණය | 500 | 450 |
| වෙළඳ බඩු තොගය | 300 | 880 |
| දේපල පිරියත උපකරණ | 3 700 | 4 000 |
| වෙළඳ ණයහිමියෝ | 700 | 900 |
| වෙළඳ ණයගැතියෝ | 250 | 550 |
| මුදල් | 460 | 725 |
| 12% ආයෝජන | - | 400 |

මුදල් ලැබීම් හා ගෙවීම්වලට අදාල තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | (රු 000) |
|---|---|
| ණයහිමි ගෙවීම් | 2 700 |
| විවිධ වියදම් | 427 |
| ලී බඩු මිලදී ගැනීම් | 500 |
| ආයෝජන ආදායම් ලැබීම් | 12 |

අමතර තොරතුරු

- ආයෝජන 2012.08.01 දින මිලදී ගෙන ඇත.
- බැංකු ණය පොලී රු 45 000ක් උපචිතව ඇත.
- 2012.12.31 දිනට පවතින බැංකු ණය කොටස ඉදිරි වර්ෂ 3ක් තුල සමාන වාර්ෂික වාරිකවලින් ගෙවිය යුතුවේ.
- ආපසු යැවුම් රු 320 000ක් , ලද වට්ටම් රු 80 000ක් හා දුන් වට්ටම් 120 000ක් ද වේ.
- විකුණුම් පිරිවැයට 25%ක ලාභයක් සහිතව විකුණුම් මිල නියමකිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.
- මුදල් පොතේ වෙනසක් ඇති වුවහොත් එය අමතර යෙදවූ ප්‍රාග්ධනය හෝ ගැනිලි ලෙසට සැලකිය යුතුය.

**අවශ්‍ය වන්නේ,**

1) 2012.12.31 න් අවසන් වූ අර්ධ වර්ෂයේ ඉපයූ ලාභය හෝ අලාභය
2) 2012.12.31 දිනට හිමිකම්, ජංගම නොවන වගකීම් හා ජංගම වගකීම් (ලකුණු 07)

(මුළු ලකුණු 15)

**අවශ්‍ය වන්නේ,**

(i) යලි ඇණවුම් ප්‍රමාණය.

(ii) යලි ඇණවුම් මට්ටම.

(iii) උපරිම තොග මට්ටම.

(iv) උපරිම තොග මට්ටම කරා යොමු වීම සම්බන්ධයෙන් ඔබගේ අදහස කුමක් ද?

(v) උපරිම මාසික තොග පරිභෝජනය ඒකක 700ක් වූයේ නම් ගබඩා ධාරිතාව ප්‍රමාණවත්ද? නැද්ද? යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**
**(මුළු ලකුණු 15)**

***